පසුගිය දින ඉරිදා මව්බිම (11/15) පුවත්පතේ 04 වන පිටුවේ "දුමින්ද නිදහස් කළ යුත්තේ ඇයි?" යන සිරස්තලයෙන් යුතුව පළව තිබූ ලිපිය තුල කරුණු ඉදිරිපත් වී තිබුණේ දුමින්ද සිල්වා නිදහස් කිරීම ඔහුට යුක්තිය ඉටු කිරීමක් සහ ගරු අධිකරණයේ විශ්වාසය හා ගෞරවය ආරක්ෂා කිරීමක්, සිදුවූ වරද නිවැරදි කිරීමක් ලෙස දක්වමිනි. මෙහිදී එවකට නියෝජ්‍ය ඇමති රන්ජන් රාමනායක, විනිසුරු පද්මිණී රණවක සහ එවකට ජනපති මෛත්‍රීපාල සිරිසේන අතර ඇතිවූවා යැයි පැවසෙන දුරකථන සංවාදයක්ද, රන්ජන් රාමනායක හා එවකට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරී ශානි අබේසේකර අතර ඇතිවූවා යැයි පැවසෙන දුරකථන සංවාදයක්ද ඇතුළත් කරමින්, දුමින්ද සිල්වාට අධිකරණයෙන් ලබාදුන් නඩු තීන්දුව සාධාරණ දැයි ප්‍රශ්න කර සිටී. මෙම ලිපිය සම්බන්ධයෙන් වන අපගේ නිරීක්ෂණයන් මෙසේයි.

1) මෙම සිදුවූවා යැයි කියැවෙන දුරකථන සංවාදයන් සම්බන්ධ විමර්ශණ අවසන් වී ඒ පිළිබඳව තීන්දුවක් ලැබී තිබේද? එසේ නැතිනම්, එම දුරකථන සංවාද නිශ්චිතව සිදුවූ බව සහ එම සංවාදයන්හි සන්දර්භය දුමින්ද සිල්වා නඩු තීන්දුවට සෘජුවම අදාළ බව මව්බිම පුවත්පත නිශ්චිතව නිගමනය කොට ඇත්තේ කුමන පදනමකින්ද?

2) නඩු තීන්දුවක් හෝ අධිකරණයේ ස්වාධීනත්වය සම්බන්ධයෙන් සලකා බැලීමට මාධ්‍යයකට හැකියාව ඇති නමුත්, එහිදී සිදුවිය යුත්තේ ඒ සඳහා පදනම් වන කරුණු ඉදිරිපත් කිරීම සහ ඒ ඔස්සේ ඒ පිළිබඳව වන සැකශංකාවන් දැක්වීමයි. එසේ නොමැතිව, එම නඩු තීන්දුව කුමන්ත්‍රණයක ප්‍රතිඵලයක් බව සහ එම නඩු තීන්දුවට අදාළ අධිකරණ ක්‍රියාවලිය දෝෂ සහගත බව නිශ්චිතව පැවසීමේ පදනම කුමක්ද? එය නිල වශයෙන් අදාළ අධිකාරීන් ඔස්සේ තහවුරු වී තිබේද?

3) එසේ නොමැති නම්, අධිකරණය විසින් ලබාදුන් නඩු තීන්දුවන් නිවැරදි නොවේ යයි මාධ්‍යයක් මගින් නිශ්චිතයක් ලෙසින් ඉදිරිපත් කිරීම ගැටළුකාරී නොවන්නේද?

මේ සම්බන්ධයෙන් මේ ආකාරයේම ලිපියක් ඔක්තෝබර් 04 මව්බිම පුවත්පත මගින්ද ඉදිරිපත් කොට තිබිණි. එසේම එම ඔක්තෝබර් 04 ලිපියත්, මෙම දැක්වෙන නොවැම්බර් 15 ලිපියත් යන දෙකම ලියා ඇත්තේ එකම මාධ්‍යවේදියෙකු විසින් බවද මෙහිදී සඳහන් කිරීම වටී.
ඔක්තෝබර් 4 මව්බිම ලිපිය පිළිබඳව අප කළ විමසුමට මෙතැනින් ප්‍රවේශ වන්න:**https://www.facebook.com/ethicseye/photos/1263692627319125**

**#MediaEthicsSL #lka #SinhalaPress #SundayMawbima**